ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය,
ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයය
ඩුබායි,

දයාබර දෙමව්පියන් වෙත,

2008/ 2009 අධ්‍යාපන වසරේ අවසානය වෙත අප ලඟාවී සිටින්නෙමු.

ග්‍රීෂ්ම නිවාඩුව සඳහා දහම් පාසල මැයි මස 22 වැනි සිකුරාදා සිට සැප්තැම්බර් මස 04 වැනිදා දක්වා (එම දෙදිනද ඇතුලත්ව) වසා තබන අතර නැවත අධ්‍යාපන කටයුතු සඳහා විවෘත වනුයේ සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා දිනයේදිය.

නොයෙක් ක්‍රියා කාරකම් ඇතුලත්වූ ඉතාම කාර්ය බහුල ලෙස ගෙවූ මෙම අධ්‍යාපන වසරේ පාසල් කටයුතු සාර්ථක කර ගැනීමට හැකිවූයේ ඔබ සැමගෙන් ලද නොමද සහයෝගය නිසා බව සඳහන් කරන අතර, රටට දැයට හිතැති දූ පුතුන් පිරිසක් බිහි කිරිම අරමුණ කරගත් දහම් පාසලේ කටයුතු සාර්ථක කර ගැනිම සඳහා ඔබගේ නොවක් සහයෝගය ඉතිරියටත් අපේක්ෂා කර්මු.

දහම්පාසලේ පුස්තකාලය දියුණුකිරිම සඳහා සිසුන්ගේ දනුම වඩන සිංහල පොත් අවශ්‍ය වී ඇත. කරුණාකර මේ සඳහා සුදුසු පොත් නව පාසල් වාරය ආරම්භයේදි අප වෙත ලැබෙන්නට සලස්වන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි,
සංවිධායක කමිටුව